# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ

## භාණ්ඩ සැපයුම්කරුවන් සේවා සැපයුම්කරුවන් හා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2020

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 13 සඳහා 2020 වසර වෙනුවෙන් භාණ්ඩ සැපයුම්කරුවන්, සේවා සැපයුම්කරුවන් හා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කරනු ලැබේ. ලියාපදිංචියට අදාල කාණ්ඩ පහත පරිදි වේ.

1. යන්ත්‍ර සූත්‍ර
2. පරිගණක, පරිගණක උපාංග සහ ජාලකරණය
3. කාර්යාල උපකරණ
4. කාර්යාල ලිපි ද්‍රව්‍ය, ටොනර් වර්ග
5. ගෘහ භාණ්ඩ මිලදී ගැනීම/සකස් කිරීම
6. මුද්‍රණ කටයුතු හා ප්‍රචාරක අයිතම
7. ගොඩනැගිලි ද්‍රව්‍ය
8. රෙදිපිළි සහ සම්භාණ්ඩ
9. ක්‍රීඩා භාණ්ඩ
10. රථ වාහන අවශ්‍යතා
11. සේවා සැපයීම්
12. සියළුම අළුත්වැඩියා කටයුතු
13. උත්සව හා සුබසාධන භාණ්ඩ
14. ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්
15. ආහාරපාන සැපයීම
16. වෙනත්

කොන්දේසි -

1.අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ව්‍යාපාරිකයන් විය යුතුය.

2. කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් හෝ කොළඹ දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශිය ලේකම් කාර්යාල 13 මගින් 2019 ඔක්තෝම්බර් 01 දින සිට කාර්යාලිය වැඩ කරණ දිනයන්හි දී පෙරවරු 9.00 සිට පස්වරු 2.00 තෙක්, 2019 නොවැම්බර් 30 දින දක්වා, එක් කාණ්ඩයක් සඳහා ආපසු නොගෙවන රු.300/-ක මුදලක් ගෙවා අයදුම්පත් ලබා ගත හැකිය.එක් කාණ්ඩයක් යටතේ අනු කාණ්ඩ ඇති අතර, අයදුම්කරනු ලබන සෑම අනු කාණ්ඩයක්ම පැහැදිලිව දැක්විය යුතුය.චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාර ගනු නොලබන අතර,අයදුම්පත් ප්‍රතික්ෂේප වුව හොත් ලියාපදිංචි ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

3.සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019 නොවැම්බර් 30 දින ප.ව. 2.00 ට පෙර අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ලිපිනයන්ට සෘජුවම ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතු අතර,දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අයදුම්පත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05. ලිපිනයට පමණක් ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් එදිනට පෙර භාර දිය යුතුය.

4.අයදුම්පත් ලබා ගැනීමට පෙර පරික්ෂා කර බැලිය හැකි අතර වැඩි විස්තර සඳහා ගණකාධිකාරි දුරකථන අංක. 011- 2368152, 011- 2369143 අමතන්න.

දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
ඇල්විටිගල මාවත,නාරාහේන්පිට,
කොළඹ 05.